# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,447 - 2006 මැයි 26 වැනි සිකුරාදා - 2006.05.26

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 618 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 619 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | 620 |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 621 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 622 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 ජුනි මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 මැයි මස 19 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - කන්තලේ

### රාජසන්තක කරන ලද වාහන විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීම

මෙම අධිකරණයේ පහත විස්තර සඳහන් වාහන ටෙන්ඩරයේ විකිණීම සඳහා මිල ගණන් මෙයින් කැඳවනු ලැබේ.

අදාල වාහන මිලදී ගැනීමට අපේක්ෂා කරන්නන් තම මිල ගණන් මෙම අධිකරණය මගින් නිකුත් කරනු ලබන ටෙන්ඩර් ආකෘති පත්‍රයක් මගින් පමණක් එක් එක් වාහනය සඳහා වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය. එකී ටෙන්ඩර් පත් හා ටෙන්ඩර් කොන්දේසි ඇතුළත් විස්තර පත්‍රිකාව එක් වාහනයක් සඳහා රු. 100 ක ආපසු නොගෙවන හා රු. 1,000 ක ආපසු ගෙවන මුදලක් අධිකරණයේ තැන්පත් කිරීමෙන් පසු 2006.06.12 සිට 20 දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ. ව. 10.00 සිට ප. ව. 4.00 දක්වා කාලය තුළ මෙම අධිකරණ කාර්යාලයෙන් ලබාගත හැකි. එකී කාලය තුළ අදාළ වාහන පරීක්ෂා කර බැලිය හැකි බවද දන්වමි.

තවද නිසි ලෙස සම්පූර්ණ කරන ලද මිළ ගණන් ඇතුළත් ටෙන්ඩර් පත් 2006.06.21 දින ප. ව. 2.00 දක්වා භාරගනු ලබන බවද මෙයින් වැඩිදුරටත් දන්වමි.

### විකිණීමට නියමිත වාහන

| *නඩු අංකය* | *වාහන අංකය* | *වාහන වර්ගය* | |
|---|---|---|---|
| 3283/03 | 26 ශ්‍රී 6513 | ඉසුසු 250 ලොරි | 01 |
| 6170/04 | 21-2272 | බජාජ් ත්‍රිරොද රථ | 01යි |

ආර්. එස්. ඒ. දිසානායක,
අතිරේක දිසා විනිසුරු.

2006 මැයි මස 05 වැනි දින,
කන්තලේ මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය

05-358

---

## අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණය

### මෝටර් වාහන විකිණීම - අදාළ විස්තර හා කොන්දේසි

අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 08/2003 ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මේ සමඟ විස්තර සඳහන් කොට ඇති මෝටර් වාහන ටෙන්ඩර් කැඳවා විකිණීම සඳහා කටයුතු කරනු ලැබේ.

*කොන්දේසි :*

01. මෝටර් වාහන මිළදී ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන මිල ගනන් අදාළ ආකෘතිපත්‍රයක් මගින්ම අයදුම් කළ යුතු අතර, එක් වාහනයක් සඳහා එක් අයදුම්පත්‍රය බැගින් ඉදිරිපත් කල යුතුවේ. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රයේ මුල් පිටපත සහ එහි අනුපිටපත වෙන වෙනම කවරවල බහා එම කවර දෙකෙහි මුල් පිටපත සහ අනුපිටපත යනුවෙන් සඳහන්කර 9 x 4 ප්‍රමානයේ එක් කවරයක බහා මුද්‍රා තැබිය යුතු අතර, එම ලියුම් කවරයේ වම් කෙලවරේ උඩ ටෙන්ඩර් කැඳවීම සඳහා මිළ ගණන් යනුවෙන් සඳහන් කළ යුතුය. (අදාළ අයදුම්පත්‍ර මෙම කාර්යාලයෙන් ලබාගත හැක.)

02. ටෙන්ඩර් අයදුම්පත් සඳහා ආපසු ගෙවනු නොලබන රු. 100 ක් වූ ටෙන්ඩර් ගාස්තුවක් හා ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදල් වශයෙන් රු. 5000 ක් ගෙවිය යුතු අතර, ටෙන්ඩර් අයදුම්පත් සමඟ මුදල් ගෙවන ලද රිසිට් පතෙහි පිටපතක් ද අමුනා එවිය යුතුය.

03. නිසි ලෙස සම්පූර්ණ කරනු ලැබූ මිළ ගනන් අඩංගු අයදුම්පත්‍ර 2006.06.30 වැනි දින දහවල් 12.00ට පෙර ලැබෙනසේ, "රෙජිස්ට්‍රාර්, මහෙස්ත්‍රාත් අධිකරණය, අනුරාධපුර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අදාළ ලිපිනයට අතින් හෝ ගෙනැවිත් භාර දිය යුතුය. නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. 2006.05.26 දින සිට 2006.06.28 දින දක්වා සඳුදා, බදාදා හෝ සිකුරාදා යන දින තුනෙන් එකකදී කාර්යාලීය වේලාව තුළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්ගේ අවසරය මත වාහන පරීක්ෂා කර බැලිය හැක.

05. අයදුම්පත්‍රයේ තොරතුරු පැහැදිලිව සටහන් කර තැබිය යුතුවේ. විශේෂයෙන් මිලගණන් දක්වන තීරයේ එම මිල ගණන් පැහැදිලිව සටහන් කර එවිය යුතු අතර, ඒවා කපා නැවත ඒ මත ලිවීම හෝ වෙනස් කිරීම් නොකල යුතු අතර, විකෘති වී ගිය මිළ ගණන් සහිත අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ටෙන්ඩර් අයදුම්පත් ලබා ගැනීම සඳහා මුදල් ගෙවනු ලබන අය නමින් රිසිට්පත් නිකුත් කරනු ලබන අතර එම රිසිට්පත් නිකුත් කළ අයගේ නමින් පමණක් ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ. එසේ නොවන ටෙන්ඩර් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. 2006.06.30 දින ප.ව. 1.00ට ටෙන්ඩර් විවෘත කරනු ලබන අතර, ඒ සඳහා ඔබ හෝ ඔබ විසින් බලය පැවරූ නියෝජිතයකු අනිවාර්යයෙන් සහභාගි විය යුතුය.

08. එක් එක් වාහනය සඳහා ලැබී ඇති මිළ ගණන් ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවේදීම ප්‍රකාශ කරනු ලැබේ. ලැබී ඇති මිළ ගණන් ටෙන්ඩර් මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන අතර, වැඩිම මිළ ගණන් ඉදිරිපත් කර ඇති (තක්සේරු මිළ හෝ ඊට වැඩියෙන්) ටෙන්ඩර්කරුට වාහනය අලෙවි කිරීමට කටයුතු කරනු ලැබේ. කිසියම් අන්දමකින් සමාන මිළ ගණන්, දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත් කර තිබුනහොත් කුසපත් ඇදීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් වාහනය මිළට ගැනීමට හිමිකම් ලබන ටෙන්ඩර්කරු තෝරනු ලැබේ. තක්සේරු මිලට අඩුවෙන් මිළ ගණන් ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. සාර්ථක ටෙන්ඩර්කරුට ලිඛිතව ඒ පිළිබඳව දක්වන අතර, ටෙන්ඩරය පිළිගත් බව දැනුම්දීමෙන් පසු එම ටෙන්ඩර්කරුවන් විසින් අදාළ වාහනයේ වටිනාකම මුදලින් ගෙවා එදිනම වාහනය අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. ඉහත පරිදි ක්‍රියා නොකරන සහ වටිනාකම් ගෙවීම් ප්‍රතික්ෂේප කරන ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු ගෙවනු නොලැබේ.

10. වාහන වල පූර්ණ අයිතිය මහෙස්ත්‍රාත් සතුවන හෙයින් මිළදී ගත් අයගේ නමින් අයිතිය පවරා දීමට අවශ්‍ය කටයුතු ඉටු කර දෙනු ලැබේ.

11. මෙම වාහන විකිණීම සම්බන්ධ පූර්ණ අයිතිය මහෙස්ත්‍රාත් සතුවන බව වැඩිදුරටත් දැනුම් දෙමි.

වසන්ත ජිනදාස,
මහෙස්ත්‍රාත් - අනුරාධපුර.

2006 අප්‍රේල් මස 24 වැනි දින,
අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**ටෙන්ඩර් කැඳවා විකිණීමට නියමිත රථ වාහන**

| *අනු අංකය* | *නඩු අංකය* | *වාහන අංකය* | *විස්තරය* |
|---|---|---|---|
| (1) | - | 47-2422 | අබලන් ලොරි රථය |
| (2) | - | 41 ශ්‍රී 1532 | අබලන් ලොරි රථය |

05-313

# බඩු බාහිරාදිය විකිණීම්

## මහේස්ත්‍රාත් අධිකරණ – යාපනය

### අධිකරණය මගින් රාජ්‍ය සන්තක කරන ලද හා මෙතෙක් අයිතිවාසිකම් පවරනු නොලැබූ භාණ්ඩ විකිණීම

යාපනය මහේස්ත්‍රාත් අධිකරණයේ පහත සඳහන් නඩුවලට අදාළ රාජ්‍ය සන්තක කරන ලද හා මෙතෙක් අයිතිවාසිකම් පවරනු නොලැබූ පහත සඳහන් කර ඇති භාණ්ඩ මෙම අධිකරණ භූමිය තුළ තබා 2006.06.24 දින පෙරවරු 9.00 ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ඇත.

02. මෙහි පහත සඳහන් කරනු ලැබූ කිසියම් භාණ්ඩයක් සඳහා කිසිවෙකු අයිතිය පවරනු ලබන්නේ නම් තම ඉල්ලීම වෙන්දේසිය පටන්ගැනීමට පැය භාගයකට පෙර ඉදිරිපත් කල යුතුය.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්ගේ අවසරය මත වෙන්දේසිය පටන්ගැනීමට පැය භාගයකට පෙර මහජනයාට මෙම භාණ්ඩ නැරඹිය හැක.

04. ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට තබා ඇති කිසියම් භාණ්ඩයක වටිනාකමට මිළ නොලැබේනම් වෙන්දේසියේ දී එම භාණ්ඩ ආපසු ලබාගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතිනු ඇත.

05. විකුණනු ලැබූ භාණ්ඩවලට එවෙලෙහිම මුදල් ගෙවා භාණ්ඩ ඉවත් කල යුතුයි සෑම ගෙවීමක්ම මුදලින්ම ගෙවිය යුතු වන අතර චෙක්පත් භාර ගනු නොලැබේ.

ආර්. ටී. විග්නරාජා,
මහේස්ත්‍රාත් යාපනය.

2006 අප්‍රේල් මස 27 වැනි දින.

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තර | ගණන |
|---|---|---|---|
| 01 | ඒ/156/05 | සුපර් කප් මෝටර් සයිකල් | 01 |
| 02. | ඒ/311/03 | මෝටර් සයිකල් | 01 |
| 03. | ඒ/229/04 | කුකුවිලකු (පහන) | 02 |
| 04. | ඒ/217/05 | අත් ඔරලෝසු | 06 |
| 05 | ඒ/420/05 | කැමරා එම වාජර, රූපවාහිනී යන්ත්‍ර | 01 |
| | ඒ/420/05 | මහන මැෂින් | 07 |
| | ඒ/420/05 | මෝටර් | 19 |
| 06. | ඒ/422/05 | කටු කම්බි රෝල් | 01 |
| | ඒ/422/05 | විදුලි පංකා | 01 |
| | ඒ/422/05 | රූපවාහිනී යන්ත්‍ර | 01 |
| 07. | ඒ/426/05 | පා පැදි | 15 |
| 08. | ඒ/459/05 | රූපවාහිනී යන්ත්‍ර | 01 |
| | ඒ/459/05 | අත් ඔරලෝසු | |
| | ඒ/459/05 | මෝටර් සයිකල් | 02 |
| 09. | 9020 | දොරවල් | 01 |
| 10. | ඒ/128/03 | මෝටර් සයිකල් | 01 |
| 11. | 988 | ගුවන්විදුලියන්ත්‍ර | 01 |
| 12. | බී/284/99 | අත් ඔරලෝසු | 01 |
| 13. | බී/17/03(7210) | රූපවාහිනී යන්ත්‍ර ක්‍රියා විරහිත | 01 |
| 14. | බී/18/03/(7209) | රූපවාහිනී යන්ත්‍ර ක්‍රියා විරහිත | 01 |
| 15. | 11734 | රේඩියෝ(බපල්) | 04 |
| 16. | 1298 | ගුවන්විදුලියන්ත්‍ර | 01 |
| 17. | බී/109/01 | පාපැදි | 01 |
| 18. | 1714 | පාපැදි | 01 |
| 19. | 1043 | පාපැදි | 02 |
| 20. | 4385 | පාපැදි | 01 |
| 21. | 8174 | පාපැදි | 03 |
| 22. | බී/278/99 | නලලිං පොම්ප | 01 |
| | | හිස් බෝතල් | |
| | | යකඩ බැරල් | |
| | | ප්ලාස්ටික් කෑන් | |
| | | මුට්ටි | |
| | | තඹ බට | |

05-333

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## නාත්තන්ඩිය ප්‍රාදේශීය මහලේකම් කොට්ඨාසය

2006 ජූලි මස 01 වැනි දින සිට 2007 ජූනි මස 30 වැනි දින දක්වා කාලය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2006 ජූලි මස 01 වැනි දින සිට 2007 ජූනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පල වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයක්ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩර්යේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% ට ලබාගත් වටිනාකම් සහතියක් ද ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි " අංක ...... දරන...... රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය " යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2006.06.06 වැනි දින පෙ. ව. 10.00 ට පෙර නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර නාත්තන්ඩිය ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසි වලට අනුකූල විය යුතුය.

05. 2006.06.06 වැනි දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර් කරුවන් නාත්තන්ඩිය ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2006.06.20 වැනි දින පෙ. ව. 10.00 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර නාත්තන්ඩිය ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එස්. එම්. එල්. චන්ද්‍රසිරි,
ප්‍රාදේශීය ලේකම්,
නාත්තන්ඩිය.

මගේ අංකය : නා/ආ/05,
2006 මැයි මස 04 වැනි දින,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය,
නාත්තන්ඩිය.

## උපලේඛනය

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ගම* | *ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ.* |
|---|---|---|---|---|
| 01. | නාත්තන්ඩිය | මුදුකටුව | 2006.06.06 වැනි දින පෙ. ව 10.00 | 1000. 0 |
| 02. | එම | කටුනේරිය | එම | 1000. 0 |

05-370

---

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බල පත්‍රය අවලංගු කිරීම

බණ්ඩාරගම බොල්ගොඩ "මෙත්සිත" හි පදිංචි මාපටුනගේ මංගල පද්මසිරි පෙරේරා වන මා විසින් 1991.11.22 දින අත්සන් කරන ලද 123 කාණ්ඩයේ 90 පත්ඉරුවේ 311 දිනපොත් අංකය යටතේ 1992.01.13 දින රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය මගින් බණ්ඩාරගම බොල්ගොඩ "මෙත්සිත" හි පදිංචි මාපටුනගේ සුනිල් අභයසිරි පෙරේරා යන අයට පවරා දුන් මාගේ ඇටෝර්නි බලය අද දින සිට අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ට කරන බව මෙයින් දැනුම් දෙමි.

එම්. එම්. පද්මසිරි පෙරේරා.

2006 ක් වූ අප්‍රේල් මස 26 වැනි දින.

04-362

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

ඉන්දිවරි ඇක්වා (ප්‍රයිවෙට් ලිමිටඩ්) ගිණුම් අංකය : 0098 1000 0607.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005 පෙබරවාරි 22 වැනි දින යෝජනා කොට සම්මත කරගනු ලැබ 2005.12.09 දින රජයේ *ගැසට් පත්‍රයේ* ද 2005.11.12 වැනි දින දිවයින අයිලන්ඩ් සහ තිනකුරල් යන දිනපතා පුවත්පත් වලද පළ කරන ලද යෝජනා සම්මුතියට අනුව ඇමරිකානු ඩොලර් හාර ලක්ෂ හතලිස් අට දහස් හත්සිය හතලිස් අටයි ශත විසිපහක (ඇ. ඩො. 448,748.25) මුදල සමග තවත් ඇමෙරිකානු ඩොලර් දෙලක්ෂ අසූතුන් දහසක (ඇ. ඩො. 283,000) මුදල සඳහා ලන්ඩන් ඉන්ටර් බැංකුව මගින් පිරිනමන අනුපාතයට වැඩි, වසරකට සියයට දෙකයි දශම හත (2.7%)බැගින් 2004 දෙසැම්බර් මස 10 වැනිදා සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩන්ස්ටන් කෙලාට් විසින් 2006.06.20 දින පෙ. ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ උතුරු පිටිගල් කෝරළේ, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ උතුරු මුන්නේස්වරම් පත්තුවේ සිත්තමඩම පිහිටි ශාන්ත මාටින් වත්ත නැමති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. බී. කලවානේගම විසින් සාදන ලද 1994 නොවැම්බර් 14 දාතම හා අංක 724 දරන පිඹුරේ නිරූපිත, ලොට් 1 වශයෙන් ලකුණු කොට දක්වා ඇති හලාවත ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව සී 143/39 හි ලියාපදිංචි කොට ඇති එකී අංක 724 පිඹුරට අනුව, උතුරට: එකී පිඹුරේ ජාතික පශු සම්පත් සංවර්ධන මන්ඩලයට අයත් වත්තද, නැගෙනහිරට: එම ඉඩමේ ම කොටසක් ද, දකුණට: එකී පිඹුරේ නිරූපිත පාර ද සහ බටහිරට: එම ඉඩමේ ම කොටසක් ද මායිම් වන, ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් දෙකක් (අක් 2 රූඩ් 3 පර් 2) වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ ඉඩම එහි පිහිටි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේ සමගය. .

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

05-391

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 18/68740/වයි 18/651.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2004.11.25 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.07.16 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කුරුණෑගල මල්කඩුවාව වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවතේ, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජේතිලක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.06.24 වැනි දින පස්වරු 1.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දියකලමුල්ල පිහිටි කහටගහමුලවත්ත *නොහොත්* මහගෙදර වත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ආර්. ඒ. චන්ද්‍රරත්න විසින් සැකසුණු 1992.06.03 දින හා අංක 1534/92 දරන පිඹුරේ කැබලි අංක 21 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0 පර්. 20 ක්වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක කේ 148/51 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන* සාමාන්‍යාධිකාරී.

2006 මැයි මස 11 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 03.

05-396/3

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 18/69137/වයි 18/712.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ*

2004.09.24 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.05.26 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කුරුණෑගල මල්කඩුවාව වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවතේ, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජේතිලක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.06.24 වැනි දින මධ්‍යහ්න 12.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයේ තලම්මැහැර පිහිටි දෙල්ගහමුල වත්ත *හෙවත්* ඉන්න වත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ආර්. ඒ. චන්ද්‍රරත්න විසින් සැකසුණු 1999.01.09 දින හා අංක 1850 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ, 0 පර්. 33 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එල් 171/114 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන* සාමාන්‍යාධිකාරී.

2006 මැයි මස 11 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 03.

05-396/2

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් - අවිස්සාවේල්ල ශාඛාව

(හිරුණි කන්ස්ට්‍රක්ෂන්ස්) 2006.06.01 දින පස්වරු 12.30 ඉහත සඳහන් වෙන්දේසියේ 2006.05.11 වැනි දින *ගැසට් පත්‍රයේ* පළ වූ දැන්වීම පහත සඳහන් අයුරින් සංශෝධනය විය යුතුයි.

ඒ අනුව විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2006.05.11 වැනි දින *රජයේ ගැසට් පත්‍රය*, ලංකාදීප සහ අයිලන්ඩ් පත්‍ර ද බලන්න.

වැඩි විස්තර සඳහා විමසන්න :

එල්. බී. සේනානායක- සාම විනිසුරු,
බලයලත් ජ්‍යෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු සහ
උසාවි කොමසාරිස්, කොළඹ වාණිජ මහාධිකරණ සහ
දිසා අධිකරණය, බලයලත් ජ්‍යෂ්ඨ වෙන්දේසිකරු,
රාජ්‍ය බැංකු සහ වාණිජ බැංකු,
අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 2445393.

2006 මැයි මස 09 වැනි දින,
කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්,
අංක 76, කොළඹ පාර,
අවිස්සාවේල්ල.
දුරකථන අංක : 036-2231303 - 4 036-2231301
ෆැක්ස් අංකය : 036-2231302.

05-340

---

## මහජන බැංකුව – තිඹිරිගස්යාය ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිට කෝරළේ පල්ලේ පත්තු මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ ගංගොඩවිල පිහිටි "අඹගහකුඹුර" සහ "ලන්සියාදෙනිය ඕවිට" යනුවෙන් හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු සී. ඒ. විතාරණ විසින් සාදන ලද 1992.05.30 දින සහ 9224 අංක දරන පිඹුරේ ලොට් 2 සහ ලොට් 4 (වටරවුම සඳහා වෙන් කර ඇත) සහ බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද 1970.11.25 දින සහ 1523 දරන පිඹුරේ ලොට් 1 ඊ (අඩි 10 පාර සඳහා වෙන් කර ඇත) වශයෙන් නිරූපිත බෙදා වෙන්කළ ඉඩම් කොටස වරිපනම් අංක 19/4, 1 වැනි පටුමග ගංගොඩවිල.

ඉඩම ප්‍රමාණයෙන් ලොට් 2- අ. 0 රූ. 0 පර්චස් 6. 50 ලොට් 4- අ. 0 රූ, 0 පර්චස් 2.10 (වටරවුම සඳහා වෙන්කර ඇත) ලොට් 1 ඊ– අ. 0, රූ. 0 පර්චස් 4.9 (අඩි 10 ක පාර සඳහා වෙන්කරවා ඇත)

එහි පිහිටි ගොඩනැගිලි සහ සියලු දේද මාර්ග අයිතිය ද සමග මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලතල අනුව 2006 ජූනි මස 14 වැනි බදාදා පෙ. ව. 10.30 ට ආරම්භව පිහිටි ස්ථානයේ යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා කරුණාකර 2005.01.07 දින දරන *රජයේ ගැසට්* පත්‍රය ද 2004.11.24 දින දරන ඩේලි නිව්ස්, දිනමිණ පුවත් පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– මිල තීන්දුවනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් වටිනාකම් මුදලින් ගෙවීමට සිදුවේ.

1. ගැණුම් මිලෙන් 10%;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු බද්ද පළාත් අධිකාරි බද්ද ගැණුම් මිලෙන් 1%ක්;
3. 2 1/2%ක් වන (සියයට දෙකහමාරක් වන) වෙන්දේසිකරුගේ කොමිස් මුදල;
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500යි;
5. විකිණීමේ පිරිවැය හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා;
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තුව.

ගැණුම් මිලෙන් ඉතිරි 90% මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත කොළඹ 01, ආදිපාද වීදිය, අංක 11 මහජන බැංකුව (බස්නාහිර කලාප) සහකාර සමාන්‍යාධිකාරි වෙත ගෙවිය යුතු ය. දුරකථන අංක :2387068, 2393678.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාල ලිපිලේඛන පූර්වෝක්ත ලිපිනයෙන් ලබාගත හැකිය. ඉහත සඳහන් පරිදි එකී මුදල දින 30ක් ඇතුළත ගෙවනු නොලැබුවේ නම් ගැණුම් මිලෙන් දැනටමත් ගෙවා ඇති 10% (සියයට දහය) අහිමි කොට දේපල නැවත විකිණීමේ අයිතිය බැංකුව සතුය.

ශොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ.

| *ප්‍රධාන කාර්යාලය* : | *නගර කාර්යාලය* : |
|---|---|
| අංක 24, ටොරින්ටන් පාර, | අංක 55ඒ, ධර්මපාල මාවත, |
| මහනුවර. | කොළඹ 3. |
| දුරකථන අංකය :081-2227593 | දුරකථන අංකය :2441761 |
| දුරකථන/ෆැක්ස් :081-2224371 | දුරකථන/ෆැක්ස් :2448526 |
| | ඊමේල් : samera@sri.lanka.net |

05-359

## මහජන බැංකුව- නාත්තන්ඩිය ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

පුත්තලම හෙට්ටිවීදියේ අංක 116 දරන ස්ථානයේ පිහිටි නිවසක් සහිත වටිනා දේපළ, විශාලත්වය අක්කර 00, රූඩ් 00, පර්චස් 11.8 මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ ම විසින් 2006.06.14 දින පෙ. ව. 11.00ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2005.12.23 දින ද, දිනමිණ පුවත්පතේ 2006.02.10 දිනදී ද ඩේලිනිවුස් පුවත්පතේ 2006.02.13 දින ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම*.– පුත්තලම ප්‍රධාන තැපැල් කාර්යාලය ඉදිරිපිටින් දකුණට ඇති කුරුණෑගල පාරේ මීටර් 150ක් ගොස් දකුණට හැරී මීටර් 600ක් ඉදිරියට ගිය විට පාරේ දකුණු පස දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ප්‍රමාණයන් මුදලින් ගෙවිය යුතුය.

01. ගැනුම් මිලෙන් 10%;
02. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%;
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 21/2%;
04. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500ක් ;
05. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල;
06. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත නාත්තන්ඩිය පිහිටි මහජන බැංකුව, - හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක 032 – 2253300/ 032-2253301 ෆැක්ස් 032-2255247

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්ලිව්. පී. සී. පෙරේරා,
වෙන්දේසිකරු සහ තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු පාර,
මීගමුව.
දුරකථන අංක: 031 – 2223219
031 –2277518

05-369

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 1/28367/සීබී9/650.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2005.08.05 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.09.26 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කැස්බෑව, වලව්වත්ත, අංක 228 ඒ, ධම්මිකා හි බලයලත් වෙන්දේසිකාර ඒ. එස්. ලියනගේ මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.06.29 වැනි දින පෙරවරු 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දෙමළදූව පිහිටි වල්ගොන්නගහවත්ත නමැති ඉඩමේ බලයලත් මනින්දෝරු එච්. ලාල් ගුණසේකර විසින් සැකසුණු 1991.12.08 දින හා අංක 4016 දරන පිඹුරේ කැබලි අංක 2 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 20 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එම් 1395 /278 යටතේ ලියාදිංචි කොට ඇත.

තවද, බටහිර මායිම මතින් වැටී ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන* සාමාන්‍යාධිකාරී.

2006 මැයි මස 11 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 03.

05-396/1

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : පීපී/03/01132/ඩී 3/971.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය

විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2003.12.05 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.07.12 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කුරුණෑගල, මල්කඩුවාව වටරවුම් පාරේ, ගම්මඩුගොල්ල මාවතේ අංක 15 හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජේතිලක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.06.24 වැනි දින පෙරවරු 9.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කෑගල්ල දිස්ත්‍රික්කයේ, අවිස්සාවේල්ල ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ වහරක පිහිටි ඇල ඉස්මත්තේ හේන නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජී. එල්. විජේවර්ධන විසින් සැකසුණු 1999.08.31 දින හා අංක 95/99 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ, 3 පර්. 18ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එස් 149/68 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන* සාමාන්‍යාධිකාරී.

2006 මැයි මස 11 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 03.

05-396/4

---

## සීමාසහිත සෙලාන් බැංකුව – තිස්සමහාරාම ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගිණුම් අංකය - 0370 - 03003903 - 001.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම් පත්තුවේ දකුණු රංකෙළිය පිහිටි බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවර්ධන විසින් සාදන ලද 1997.08.31 දිනැති අංක 581 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පතිරත්නගම *හෙවත්* රංකෙළිය කැබලි අංක 122262-12273 නමැති ඉඩමේ කැබලි අංක කේ 1 ලකුණු කළ බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර දෙකයි පර්චස් තුනයි දශම පහයි හතරක් (අ. 2, රූ. 0, පර්. 3.54) විශාල ඉඩම.

මෙම දේපල තිස්සමහාරාමයේ පදිංචි විරිත්ත මුල්ල ගමගේ සුමනසේන යන අය බන්ධනදායි වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපල 2006 ජූනි මස 20 වැනි දින පස්වරු 2.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉඩමට පිවිසීම.–* තිස්සමහාරාම බස් නැවතුම් පොලේ සිට කිරින්ද පාරේ. කි. මී. 05ක් ගොස් හමුවන රන්කෙළිය හංදියෙන් දකුණට ඇති රන්කෙළිය පාරේ මීටර් 600ක් ඉදිරියට ගියවිට අදාල ඉඩම පිහිටා ඇත. විශාල ඉඩමක් වූ පතිරතනගම නම් වූ ඉඩමේ කොටසක් ලෙස මෙය සඳහන් වේ.

යෝජනා සම්මුති දැන්වීම රජයේ *ගැසට් පත්‍රයේ* 2006.03.10 වන දින ද ලංකාදීප සහ ඩේලිමිරර් පත්‍රයේ 2006.02.17 වන දින ද සහ වීරකේසරි පත්‍රයේ 2006.02.23 වැනි දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.–* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසි අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

(1) ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්), (2) පලාත් අධිකාරියයට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1%ක් වන පළාත් අධිකාරි බද්ද (සියයට එකක්), (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), (4) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, (5) ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, (6) සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කළ යුතු ය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරි (නීති), සීමාසහිත සෙලාන් බැංකුව, අංක 90, ගාලු පාර, කොළඹ 03

දුරකථනය 011-2456258, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස් තක්සේරුකරු.

ටී. එන්. එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොළොන්නාව.
දුරකථන අංක 011-2696155, 011-2572940.

05-392

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධන කරන ලද ලංකා බැංකු ආඥා පනෙත් (397) අධිකාරය හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳව දැන්වීම

සිංගප්පූර් සෙන්ටර් හි තනි අයිතිකරු – ජී. එච්. ඩී. එස්. ගුණතුංග මහතා විසින් ලංකා බැංකුව වෙත උකස්කරන ලද දේපල

ලංකා බැංකු ආඥා පනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලදුව 2004.10.29 දිනැති අංක 1365 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* හා 2004.10.18 දිනැති දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් යන පුවත්පත් වල පළකරන ලද යෝජනා සම්මුතිය ප්‍රකාර විකිණීමේ දිනය තෙක් ලැබිය යුතු ශේෂ මුදල, පොලිය, වියදම් සහ එකී ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදී එම දේපල ඉදිරියෙන් දක්වා ඇති වේලාවන්හි දී, කොළඹ 03, ධර්මපාල මාවත, අංක 55 ඒ දරන ස්ථානයේදී පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම වෙන්දේසිකරුවන් විසින් 2006.06.17 වැනි දින ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### උපලේඛනය

*දේපල I - පෙ. ව. 11.00*

(අ) මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ. යටිනුවර ගහපළාතේ, පැලව පිහිටි හිරිවානගොඩහේන, දැන් වත්ත නමින් වූ ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. එම්. කේ. බී. මාවලගෙදර මහතා විසින් සාදන ලද 1999.08.22 වැනි දිනැති 1510 අංක දරන පිඹුර අනුව රූඩ් එකයි පර්චස් දහඅටයි දශම නවයයි හතර (අ. 0, රූ. 1, පර්. 18.94) වපසරියෙන් යුතුව එකී ඉඩමෙන් බෙදා වෙන් කරන ලද යථෝක්ත පිඹුරේ ලොට් 1 ලෙස සලකුණු කර ඇති හා විස්තර කර ඇත්තාවූ ද, උතුරට: නිවසට යන පාර නැගෙනහිරට: යූ. පී. ජයරත්න විසින් හිමිකම් කියන හිරිවානගොඩ හේන දැනට වත්ත හා යථෝක්ත ඉඩමේ ඉතිරි කොටසකි. දකුණට එකී ඉඩමේ ඉතිරි කොටසකි. උතුරට: පී. එස්. සෝමරත්න හිමිකම් කියන 718 පිඹුරේ ලොට් 2 යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩම හා ඉඩම තුළ වූ සැම සියලු දේ ම වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී. 397/232 පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

*දේපල II - ප. ව. 1.30*

(ආ) මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර, ගහපළාත යටිනුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ කොබ්බෑකඩුව ග්‍රාමය පිහිටි ගෙටතලේවත්ත (ඔප්පුව අනුව ගේතලේ වත්ත) නම් වූ ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු පී. ඩබ්. විජේවර්ධන මහතා විසින් සාදන ලද 1994 අගෝස්තු මස 12 වැනි දිනැති 4954 අංක දරන පිඹුර ප්‍රකාර එකී ඉඩමෙන් පර්චස් විසිපහක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 25) වපසරියෙන් යුක්ත වූ යථෝක්ත ඉඩමෙන් බෙදා වෙන් කළ ලොට් 1 ලෙස සලකුණු කර ඇති උතුරට: 2968 අංක දරන පිඹුරේ ලොට් අංක 1, නැගෙනහිරට: ගමේ සිට ප්‍රධාන පාරට ගමන් කරන අඩි 10ක් පළල පාර, දකුණට: ලෙට් 2, බස්නාහිරට: 1144 දරන පිඹුරේ ලොට් 2 බී යන මෙකී මායිම් තුළ වූ ඉඩම වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 409/168 පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

(ඇ) ඉහත කියන ලද අංක 4954 දරන පිඹුරේ විස්තර අනුව ඉහත සඳහන් කොබ්බෑකඩුව ග්‍රාමයේ පිහිටි ගෙටතලේවත්ත (ඔප්පුව අනුව ගේතලේ වත්ත) නම් වූ ඉඩමෙන් බෙදා වෙන් කළ ලොට් 1 ලෙස සලකුණු කළ විස්තර කර ඇති පර්චස් විසිතුනක (අක්කර 0, රූඩ් 0, පර්චස් 23) පවසරියෙන් යුත් උතුරට ලොට් 1,නැගෙනහිරට ගමේ සිට ප්‍රධාන පාරට යන අඩි 10ක් පළල පාර, දකුණට ලොට් 3, බස්නාහිරට 1954 දරන පිඹුර අනුව ලොට් 3 යන මෙකී මායිම් තුළ වූ ඉඩම වේ. මෙය මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්‍රිරු බී 409/169 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. එම්. උපතිස්ස බණ්ඩාර,
ප්‍රධාන කළමනාකාරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මහනුවර.

05-393

---

## ලංකා බැංකුව – මහියංගන ශාඛාව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2003.11.17 දිනැති අංක 1314 දරන *ගැසට් පත්‍රයේ* හා 2003.10.29 දිනැති දිනමිණ, තිනකරන්, ඩේලිනිව්ස් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළියද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය පිහිටි ස්ථානයේදී ම 2006.06.23 වැනි දින පෙ. ව. 10.00 ට බදුල්ල, කලුගල්පිටිය අංක 48/1, හි පදිංචි වෙන්දේසිකාර ඩබ්. ජයතිලක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය උප දිසාපති කොට්ඨාශයේ බින්තැන්න කෝරළයේ, අලුත් නුවර ග්‍රාමසේවා නිළධාරී කොට්ඨාශයේ අලුත්නුවර හි පිහිටි "දඹරාව ජනපදය" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් සාදන ලද 1997 පෙබරවාරි මස 02 දිනැති අංක 6842 ඒ දරන පිඹුරේ ලොට් 2 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට: අංක 554 දරන පිඹුරේ ලොට් 1 සහ මාටින් සිල්වාගේ ඉඩමද, නැගෙනහිරට: රොහාන සිට දඹරාව දක්වා මහා මාර්ගය සහ අංක 615 දරන පිඹුරේ ලොට් 1 ද, දකුණට: ඇලට වෙන්කළ කොටස සහ පූජා නගරයට යන පාර සහ දඹරාව ද, බස්නාහිර:ට ඇලට වෙන්කළ ඩී 1 සහ ඇලට වෙන්කළ එෆ්සී 19 ද, මායිම්ව එකී අංක 6842 ඒ දරන පිඹුර අනුව රූඩ් තුනයි පර්චස් දහයක (රූ. 0, රූ. 3, පර්. 10) බිම්

ප්‍රමාණය සමග එහි පිහිටි සියලු දේ වේ. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්ඩීබී 8/247 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. එම්. පී. විජේසූරිය,
කළමණාකරු.

ලංකා බැංකුව,
මහියංගනය ශාඛාව.

05-394

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව – වත්තල ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ණයඅය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 04 වන වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ හෝමාගම පිහිටි කටුවාන පාරේ, පිහිටි "මිල්ලගහවත්ත" නමැති ඉඩමට මිනුම්පති විසින් සහතික කරන ලද අංක සී. ඕ. 6996 සහ 1990 මැයි 28 වැනි දිනත් දරන මූලික පිඹුර ප්‍රකාර (අංක සී. ඕ. 6706 දරන මූලික පිඹුරේ ලොට් අංක 3 සහ 13 හි කොටස් වන) ලොට් අංක 94 දරන කොටස (ප්‍රමාණය - හෙක්ටයාර් 0.1826).

ඉහත කී පිඹුරේ ලොට් 149, 53, 62 සහ 73 ලෙස ලකුණු කළ සහ අංක 818, සහ 819 සහ 1998 පෙබරවාරි මස 09 වැනි දින දරන බැඳුම්කරවල වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ. මෙහි ඉහත විස්තර කොට ඇති ඉඩම් කොටසට බන්ධනදායිගේ ඇති කවරාකාරයේ හෝ බදු අයිතියක් බුදල් අයිතියක් අයිතිවාසිකමක් හිමිකමක් සම්බන්ධතාවයක් ප්‍රතිලාභයක් හිමිකම් පෑමක් සහ ඉල්ලීමක් සමග වේ.

පහත දැක්වෙන යන්ත්‍රෝපකරණ, නිශ්චල යන්ත්‍රාගාර සවිකිරීම් උපාංග සහ හෝමාගම, කටුවන යූ. ඩී. ඒ. කාර්මික ජනපදය තුළ පිහිටි අංක 94 දරන කර්මාන්තශාලා පරිශ්‍රය තුළ සහ ඒ මත තබා ඇති බන්ධනදායින්ගේ වෙළඳ භාණ්ඩ තොග සහ උපකරණ ද ඊට ඇතුළත්ය.

| *භාණ්ඩ විස්තරය* | *අනුක්‍රමික අංකය* | *මාදිලිය* |
|---|---|---|
| 1. පටු ප්ලූට් රෝල් සෙට් එකක් කවුන්ටර්ස් හීටර්ස්, ඉලෙක්ට්‍රිකල් සහ මිකැනිකල් ඩ්‍රයිව්ස් සහ මෝටරයෙන් ක්‍රියාකරන සෙල්ප් ලෝඩින් රීල් ස්ටෑන්ඩ් සහිත අධිබලැති කුටිල ආකාරයෙන් අඩි වේගී, සින්ගල් ජේස්, කඩදාසි රැලිකරන යන්ත්‍රය ප්‍රමාණය 56 | | එස්පී 203 |
| 2. මයික්‍රෝ සීට් අලවන යන්ත්‍රය | 1213 | එස්පී 105 |
| 3. මයික්‍රෝ බාර් හතරේ රොටරි කටින් ඇන්ඩ් ක්‍රීසින් මැෂිම | 1215 | ආර්එෆ් 1215 |
| 4. මයික්‍රෝ එසෙන්ට්‍රික් ස්ලෝවර් | 1216 | ඊඑක්ස් 306 |
| 5. මයික්‍රෝ ඇන්ගියුලර් බොක්ස් සිව්වින් මැෂිම | 1219 | එස් ඒ. 111 |
| 6. මයික්‍රෝ අධිබලැති අතින් ක්‍රියාකරන බෝඩ් කටරය | 55 | |

තවද, මෙය බලාත්මකව පවතින අතරතුර, මින්මතු කලින් කලට, ගොඩනැගිල්ලට ස්ථිරව සවිකරනු ලැබ, ඉහත පළමුවන උපලේඛනයේ විස්තර කර ඇති නිශ්චල දේපලෙහි කොටසක් ලෙස සලකනු ලබන වෙනත් සියලු යන්ත්‍රෝපකරණ සහ දැනට ඇති මින්මතු සවිකරනු ලබන යම් යන්ත්‍රෝපකරණ වෙනුවට ස්ථිරව සවිකරනු ලබන සියලුම යන්ත්‍රෝපකරණ ද ඇතුළත් වේ.

සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට මෙම දේපළ, උකස් කර ඇති "වර්ණ ඇසෝසියේට්ස්" යන නාමය සහ විලාශය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන නලින් සනත් කුමාර් වර්ණකුලසූරිය සහ උඩු විදානෙලාගේ දෝන සුධර්මා ප්‍රියන්ති පෙරේරා ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව විසින් මා වෙත පවරා ඇති බලය පරිදි ඉහත කී දේපල මා විසින් 2006 ජුනි මස 09 වැනි සිකුරාදා දින පෙරවරු 10.00 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සම්බන්ධයෙන් 2004.12.10 වැනි දින *රජයේ ගැසට්* පත්‍රයද, 2004.12.10 වැනි දින අයිලන්ඩ්, දිවයින හා තිනකරන් යන පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.–* එක් එක් වෙන්දේසියේදී මිල තීන්දු වනවාත් සමගම, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් අගයයන් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක් ;
2. ගැණුම් මිලෙන් ඉතිරි 90% වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුය;
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් වන පළාත් අධිකාරි බද්ද;
4. විකුණුම් මිලෙන් 2.5ක් (සියයට දෙක හමාරක් පමණක්) වන වෙන්දේසිකරුගේ කොමිස් මුදල;
5. රු. 30,000 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50%ක්;
6. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500;
7. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,

හිමිකම් ඔප්පු ප්ලෑන් ආදිය පිළිබඳ වෙනත් විස්තර කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479 හි සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ කළමනාකරු (අයකිරීම්) වෙතින් ලබාගෙන පරීක්ෂා කළ බැලිය හැකිය.

දුරකථන අංක : 2661815, 2661816.

අර්වින් පෙරේරා,
සාම විනිසුරු, වෙන්දේසිකරු, උසාවි කොමසාරිස්,
තක්සේරුකරු, භාෂා පරිවර්තක.

අංක 3, පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක :2810145, 077-212602.

05-386

## සීමාසහිත සෙලාන් බැංකුව – ග්‍රෑන්ඩ්පාස් ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ණයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 08 වන වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවත් තුළ බලයලත් මිනින්දෝරු එම්. බාලක්‍රිෂ්ණන් විසින් පිළියෙල කළ 1990 පෙබරවාරි 16 දාතම අංක 431 දරන බහු පාර්ශ්වීය (කොඩෝමිනියම්) පිඹුරේ විස්තර කර ඇති පංචිකාවත්ත පාරේ වරිපනම් අංක 228 දරන බිම් මහලේ ඒකක 2 යනුවෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කර ඇති මායිම්, නියම වූ ඉතා අගනා ව්‍යාපාරික පරිශ්‍රය බිම් ප්‍රමාණයෙන් වර්ග අඩි 1,623.87කින් සමන්විතයි.

ආසන්නතම පොදු ප්‍රවේශ ප්‍රදේශය වශයෙන් ඒයූ 2 ප්‍රවේශය සහිත, එකී 2 වන ඒකකය උතුරට මෙම ඒකකය (පංචිකාවත්ත පාරේ) වරිපනම් අංක 234 හා 234 ඒ දරන පරිශ්‍රයන් ගෙන් වෙන් කෙරෙන බිත්තියේ මධ්‍යයද, සහ ඒයූ 2 (පඩිපෙල) ද, නැගෙනිරට මෙම ඒකකය සීරී 2 (ගෙවතු ඉඩකඩ) වෙන් කෙරෙන බිත්තියේ මධ්‍යයද, දකුණට මෙම ඒකකය සීරී 1 ගෙවතු ඉඩකඩින් වෙන් කෙරෙන බිත්තියේ මධ්‍යය ද හා මෙම ඒකකය 1 වන ඒකකයෙන් වෙන් කෙරෙන බිත්තියේ මධ්‍යයද, බටහිරට පංචිකාවත්ත පාරේ පදික වේදිකාවෙන් මෙම ඒකකය වෙන් කෙරෙන බිත්තියේ මධ්‍යයද ඉහල මුදුනට මෙම ඒකකයට ඉහළින් පිහිටි 3 වන ඒකකයේ ගෙබිමේ මධ්‍යයද, සහ පහළ යටතට මෙම ඒකකයේ බිම් මහලද මායිම් වන, කොළඹ ඉඩම් කාර්යාලයේ ඒ 32/37 යටතේ ලියාපදිංචි කොට ඇති එකී සහාධිපත්‍ය පිඹුරේ සඳහන් ආකාරයට පොදු මූලාංගයන්ගෙන් 18.38% අනුපාතික ප්‍රමාණයක කොටස් හිමි ඒකකය.

පොදු මූල ද්‍රව්‍ය:-

(අ) ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම,

(ආ) පිටු අංක 3 බිම් මහලේ දක්වා ඇති පරිදි සීරී 1 (කහ මායිම), සීරී 2 (නිල් මායිම) සහ සීරී 3 (කොළ මායිම) යනුවෙන් ලකුණුකර ඇති ඉතිරි කොටස (සීරී යනු උද්‍යාන කොටසයි),

(ඇ) ගොඩනැගිල්ලේ අත්තිවාරම් කුළුණු මහ බාල්ක, බාල්ක, මුක්කු, ප්‍රධාන බිත්ති හා වහලය,

(ඈ) පොළොවෙහි මළ පහවන සේවාවන්,

(ඉ) ඉඩම තුළ මතුපිට කාණු,

(ඊ) ගොඩනැගිල්ලේ නඩත්තුව හා ආරක්ෂාව සඳහා සපයා ඇති වෙනත් පහසුකම්

(උ) 1. ඒයූ 1-පිළිවෙලින් පළවෙනි සහ දෙවැනි මහල් හි ඒකක 3 හා ඒකක 4 හි සෝපාන ශාලාව

2. ඒයූ 2, බිම් මහලේ ඒකක 2 ට ඇති සෝපාන ශාලාව (ඒයූ) 1 සහ ඒයූ 2, බිම් මහල් සැලැස්මේ පළමු මහල් සැලැස්මේ හා දෙවන මහලේ සැලැස්මේ පිටු අංක 3, 4 සහ 5 හි දක්වා ඇති අතිරේක ඒකක සඳහා වෙන් කර ඇත).

(ඌ) 1, සීරී 1 සිට බිම් මහලේ ඒකක 1 දක්වා,

2. සීරී 2 සිට බිම් මහලේ ඒකක 2 ට පළමු මහලේ ඒකක 3 ට හා දෙවන මහලේ ඒකක 4 ට (සීරී) සී රී 2 සහ සීරී 3 (බිම් මහලේ සැලැස්මේ පිටු අංක 3 බිම් මහලේ සීරී 3 ප්‍රවේශ ඒකකය සිට ඒකක 1 සහ 2 දක්වා

3හි පොදු කොටස් සඳහා වෙන් කර ඇත).

සහාධිපත්‍ය (කොන්ඩෝමිනියම්) දේපළ හා කොන්ඩෝමිනියම් (සහාධිපත්‍ය) දේපළ ගොඩනැගිල්ලට සාදන ලද අංක 431) දරන සහාධිපත්‍ය (කොන්ඩෝමිනියම්) සැලැස්මේ පිටු අංක 3, 4 සහ 5 හි බිම් මහල් සැලැස්මේ, පළමු මහල් සැලැස්මේ, 2 වන මහල් සැලැස්මේ දක්වා ඇති අතිරේක ඒකක ඒ යූ 2 බිම් ප්‍රමාණයෙන් වර්ග අඩි 200 වන එම් ඒ යූ 2 ඒකකය (බිම් මහල, පළමු මහල සහ දෙවන මහල (සෝපාන ශාලාව) ට මායිම්, උතුරට පංචිකාවත්ත පාරේ) වරිපනම් අංක 234 සහ 234 ඒ පරිශ්‍රයන්ගෙන් මෙම ඒකකය වෙන් කරනු ලබන බිත්තියේ මධ්‍යය නැගෙනහිරට මෙම ඒකකය 2, 3 සහ 4 වන ඒකකවලින් වෙන් කරන බිත්තියේ මධ්‍යය සීරී 2 ඉහළියන් අවකාශය (උද්‍යාන අවකාශය) දකුණට මෙම ඒකකය 2, 3 සහ 4 වැනි ඒකකවලින් වෙන් කරන බිත්තියේ මධ්‍යය, බටහිරට මෙම ඒකකය 2, 3, සහ 4 වැනි ඒකක වලින් වෙන් කරන බිත්තියේ මධ්‍යය සිතිජය (උඩ අහස් මුදුන) මෙම ඒකකයේ වහළ අධස්වසිතාක්‍ය (යට අහස් මුදුන) මෙම ඒකකයේ බිම් මහල, මෙකී මායිම් අංක 431 දරන සැලැස්ම අනුව වේ.

තවද, ඉතා වටිනා වාණිජ ඉඩම් කොටසක්.–

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ අළුත්කඩේ නැගෙනහිර (කලින් ස්කිනර්ස් පාර දකුණ යනුවෙන් හඳුන්වන ලද ශ්‍රී සංඝරා මාවතේ පිහිටි ශ්‍රී සංඝරාජ මාවතේ වරිපනම් අංක 215/1 දරන බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද අංක 2967 හා 2964 1964 අගෝස්තු මස 22 වැනි දාතම දරන සැලැස්මේ ලොට් අංක 8 වශයෙන් දක්වා ඇති (ඉඩම් ප්‍රමාණයෙන් පර්චස් 3.25ක් වූ ඉතා අගනා වාණිජ ඉඩම් කොටස (කොළඹ 10, පංචිකාවත්ත පාරේ අංක 228 හි බන්දුල ට්‍රේඩින් එන්ටර්ප්‍රයිසස් යන ව්‍යවහාර ව්‍යාපාරික නාමය යටත් නාමය, විලාශය, හා අභිධානය යටතේ තනි අයිතිකරු වශයෙන්) ව්‍යාපාර පවත්වාගෙන යන ගල්හේනගේ අජිත් බන්දුලසේන යන අයට අයත් දේපළ අංක 1342 හා 1993.09.09 දාතම දරන අංක 1492 හා 1993.11.05 දාතම දරන අංක 3346 හා 1995.06.21 දාතම දරන අංක 1203 හා 1993.07.21 දාතම දරන අංක 3255 හා 1995.05.03 සහ 698 හා 17/11/95 දාතම දරන බැඳුම්කර යටතේ බන්ධනදායී/ උකස්කරු වශයෙන් ගෙවිය යුතු ගෙවීම් පැහැර හැර ඇත.)

සීමාසහිත සෙලාන් බැංකුව විසින් මා වෙත පවරන ලද බලතල ප්‍රකාර ඉහත සඳහන් දේපල 2006 ජූනි 17 වැනි සෙනසුරාදා පෙ. ව. 10.30 ට ආරම්භව පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2000.07.21 වැනි දින රජයේ *ගැසට් පත්‍රය ද*, 2000.07.12 දින ඩේලිනිව්ස්, දිනමින පුවත්පත් ද 2000.07.26 දින තිනකරන් පුවත්පත් ද විකුණුම් නිවේදනය සඳහා 2006.05.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද බලන්න.

ගෙවන පිළිවෙල :

1. මිල තීන්දු වනවාත් සමගම ගැණුම් මිලෙන් 10%ක්,
2. ගැණුම් මිලෙන් ඉතිරි 90% වෙන්දේසි දින සිට රාජකාරි දින 30ක් ඇතුළත ගෙවිය යුතුය,
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක්) දේශීය විකුණුම් බද්ද,
4. විකුණුම් මිලෙන් 2 1/2%ක් (සියයට දෙකහමාරක්) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
5. රු. 43,145 නොඉක්මන සම්පූර්ණ ප්‍රචාරක වියදමෙන් 50%ක්,
6. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
7. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 4,000.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාල ලිපලේඛන කොළඹ 03, ගාලු පාරේ, අංක 90 හි සෙලින්කෝ සෙලාන් ටවර්හි (Ceylinco Seylan Tawer) හි 12 මහලේ සීමාසහිත සෙලාන් බැංකුවේ සහකාර සමාන්‍යාධිකාරී (නීති දෙපාර්තමේන්තුව) වෙතින් පරීක්ෂා කර බැලීමටත් පුළුවන.

දුරකථන අංක : 074-701256/7, 074-701291, 2456258.

ඩන්ස්ටන් කෙලාට්,
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර්,
විශේෂඥ වෙන්දේසිකරු, තක්සේරුකරු,
සහ දේපළ නියෝජිත.

අංක 381/1, ගාළුපාර,
කොළඹ 04.

දුරකථන අංක : 2591167,
දුරකථන/ෆැක්ස් අංක : 2584874, 2500838,
ක්ෂණික ඇමතුම් : 0772250422.

05-395